<u>ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම.</u>

1. මැදදුම්බරප්‍රාදේශියසභාවේ 2024-12-31 දිනෙන්අවසන්වර්ෂයසදහාපිළියෙලකරන ලද මූල්‍ය ප්‍රකාශනය 1988 ප්‍රාදේශිය සභා මූල්‍ය හා පරිපාලන රීති විධිවිධාන වලට අනුකූලව, පොදු සම්මත ගණකාධිකරණ මූලධර්ම වලට අනුව පිළියෙල කර ඇති අතර ගිණුම් සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කර ඇති බවටද ප්‍රකාශ කරමි.

2. සභාවේ 2024-12-31 දිනටපිළියෙලකරනලදමූල්‍යප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාවේ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරිමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් වලින් බැහැරව වත්කම් මිලදී ගත් වර්ෂයේ 100 % ක් ක්ෂය වීම් ලෙස සලකා මුළු පිරිවැය ආදායම් වියදම් ගිණුමට ප්‍රාග්ධන වියදම් යටතේ ලියා හැර අති අතර අදාල වත්කම් ශේෂ පත්‍රය නිරූපණය කිරීම සදහා ආදායම් වත්කම් ගිණුමේ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමට සිහිවටන සටහනක් ලෙස වත්කම් නිරූපණය කර ඇත.

3. සභාව විසින් ප්‍රාදේශිය සභා පනතේ දක්වා ඇති සේවාවන් ඉටු කිරීම සදහා දරණ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ගිණුමට ලියාහැර ඇත.

4. සභාවේ මුල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරිමේදි පිරිවැය මත ගිණුම්ගත කර ඇති අතර උද්ධමනය හෝ අවධමනය සැලකිල්ලට ගෙන නොමැත.

5. ස්ථාවර වත්කම් මිලදී ගත් වර්ෂයේම ක්ෂය කරනු ලබන අතර වත්කම් වල වටිනාකම තක්සේරු කර ඇත්තේ තාවකාලික තක්සේරුවක් මතය.

6. 2024-12-31 දින වන විටත් පහත වටිනාකම් සහිත වාහන සභාව වෙත අයිතිය පවරා නොමැති අතර එම වටිනාකම් ගිණුම්ගත කර නොමැත.

   I. ජීප් රථය රු: 600,000.00
   II. 32- 3975 ජීප් රථය

7. සභාවේආදායම්වියදම්ගණනයකිරීමඋපචිතපදනමමතසිදුකරඇත.
8. තොගය නිකුත් කිරීම සදහා FIFO ක්‍රමය භාවිතා කරනු ලබයි.
9. 2024-01-01 සිට 2024-12-31 න් අවසන් වර්ෂය වෙනුවෙන් පිළියෙල කරනු ලබන ගිණුම පොදුවේ පිළිගත් වික්‍රමනායක ගිණුම් ක්‍රමය අනුව සකස් කර ඇත.
10. සභාව බාහිර පාර්ශව සමග පහත නඩු විභාග වෙමින් පවතී.